# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2016 පෙබරවාරි මස 23 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**

**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.50 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**●පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණී | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු ගුණසිරි ජයනාත් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අශෝක දයාරත්න
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇන්ටනී උපුල් රාජිත
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
කේ.ඩී. අරුණ දීපාල්
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මංජුල ප්‍රසන්න සම්පත්
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
රජිත හපුආරච්චිගේ
රන්දීර් රොද්‍රිගෝ
රවීන්ද්‍ර යසස් කුමානායක
රොජර් සෙනෙවිරත්න
රොයිස් විජිත
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
විජිත් ප්‍රියන්ත
සරත් පතිරණ
සරත් සුමනසේකර
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සිරිකමල් පිලිෂියන් ද සිල්වා
සුනිල් වටගල
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
සෙනල් වෙල්ගම
සේනක දමයන්ත ද සිල්වා
ශ්‍රීනාත් පෙරේරා
හරිස්චන්ද්‍ර කොස්තා
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

අමල් සිල්වා
එස්. කුහවරදන්
කාමල් කුරුප්පු
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
චන්දන ජයකොඩි
නව්සර් ෆව්සි
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
පී.ඩී. අබේරත්න
රවී විජේසේකර
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
ලයනල් ජයසිංහ
ලලන්ත ගුණසේකර
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
ශිරන්ත අමරසේකර

## 01. ගරු සභාපතිතුමාගේ නිවේදන :

*i*

*"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ද 5 (අ) වන ව්‍යවස්ථාව යටතේ, ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව මෙම පළාත් සභාවේ අදහස් 2016 මාර්තු මස 17 වන දින හෝ ඊට පෙර පාර්ලිමේන්තුවට දන්වා එවන මෙන් දැනුම් දී තිබෙන බවත් ගරු සභාපතිතුමා විසින් දන්වන ලදි.*

*ii*

*"මෙම පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ලෙස එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ගම්පහ දිස්ත්‍රික් පළාත් සභා මන්ත්‍රී ගුණසිරි ජයනාත් මන්ත්‍රීතුමාගේ පත්වීම 2016.02.12 දින සිට ක්‍රියාත්මක වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. ලිපිලේඛන පිළිගැන්වීම :

ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමා විසින් ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත සභාවට පිළිගන්වන ලදී. [ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු විය.]

ගරු සභාපතිතුමා විසින් 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තා සභාවට පිළිගන්වන ලදී.
[පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු විය.]

## 03. කාරක සභා වාර්තා :

2016.02.10 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

***පූ.භා. 10.58 ට, ගරු සභාපති [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපති [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

***පූ.භා. 11.59 ට, ගරු නියෝජ්‍ය සභාපති [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපති [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

## 04. ශෝක ප්‍රකාශ යෝජනාව I : ආරියරත්න ජයතිලක මැතිතුමා

සුනිල් ජයමිණි ගරු සභා නායකතුමා විසින් පහත සඳහන් ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"බස්නාහිර පළාතේ පළාත් සභාවේ දෙවන පළාත් සභාවට ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ නියෝජනය කරමින් ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු පළාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් තෙරී පත් වී එම පළාත් සභා නිල කාලයද ඇතුළත් වූ වසර හයකට ආසන්න කාලයක් තුළ බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභාපති ධූරය දරමින්, බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරන ල ද ගරු ආරියරත්න ජයතිලක මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.*

*බස්නාහිර පළාතේ පළාත් සභාව, එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමාගේ අභාවය පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පළ කර සිටියි."*

***අ.භා. 12.35 ට, ගරු සභාපති [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපති [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

***ශෝක ප්‍රකාශ යෝජනාව ඇතුළත් නිල (හැන්සාඩ්) වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීතුමාගේ ඥාතීන් වෙත ලැබෙන්නට සලස්වන මෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් ලේකම්වරයාට උපදෙස් දැනුම් දෙන ලදී.***

## 05. ශෝක ප්‍රකාශ යෝජනාව II : ඉන්දික ගුණවර්ධන මැතිතුමා

සුනිල් ජයමිණි ගරු සභා නායකතුමා විසින් පහත සඳහන් ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"බස්නාහිර පළාතේ පළාත් සභාවේ දෙවන පළාත් සභාවට පොදුජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු පළාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් තෙරී පත් වී වසරකට අධික කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරන ලද හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී ඉන්දික ගුණවර්ධන මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.*

*බස්නාහිර පළාතේ පළාත් සභාව, එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමාගේ අභාවය පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පළ කර සිටියි."*

***අ.භා. 01.12 ට, ගරු නියෝජ්‍ය සභාපති [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

## 06. රීති අංක 30 යටතේ යෝජනාව :

ගාමිණී තිලකසිරි - ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"අද දින සභාවේ වැඩ කටයුතු අවසන් වන තෙක් සභාවේ කාලය දීර්ඝ කළ යුතුය."*

***ශෝක ප්‍රකාශ යෝජනාව ඇතුළත් නිල (හැන්සාඩ්) වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීතුමාගේ ඥාතීන් වෙත ලැබෙන්නට සලස්වන මෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ලේකම්වරයාට උපදෙස් දැනුම් දෙන ලදී.***

***ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් රීති අංක 30 යටතේ ඉදිපත් කරන ලද ප්‍රශ්නමාලාවට පිළිතුරු රංජිත් සෝමවංශ ගරු අධ්‍යාපන අමාත්‍යතුමා විසින් එවලේ වාචිකව සපයන ලදී.[1]***

***සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් රීති අංක 30 යටතේ ඉදිපත් කරන ලද ප්‍රශ්නමාලාවට පිළිතුරු දීම ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් කල් ගන්නා ලදී.***

## 07. කල් තැබීම :

අනතුරුව, මූලාසනාරූඪ [ලලිත් එල්ලාවල මහතා ] ගරු මන්ත්‍රීතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 01.38 ට, 2016 මාර්තු මස 08 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2016.02.24
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.
කුමා/24

[1] 2016.02.23 වන දින නිල වාර්තාවේ අදාළ පිළිතුරු පළ කර ඇත.